ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2008/2009

පරිපාලන නීතිය - LWU 3311

කාලය විනාඩි 40 යි.

---

දිනය - 2008 දෙසැම්බර් 10 වන දින          වේලාව - පෙ.ව.10.00- පෙ.ව.10.40 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. කේප්ලන්තයේ විද්‍යුත් මාධ්‍ය පනත යටතේ පිහිටුවා තිබෙන විද්‍යුත් මාධ්‍ය නියාමන කොමිසමේ බලතල අතර පෞද්ගලික රූපවාහිනී මධ්‍යස්ථානවල ට අදාළ බලපත්‍ර නිකුත් කිරීම, ඒවා අළුත් කිරීම සහ අත්හිටුවීම ද එකී මධ්‍යස්ථාන මගින් විසුරුවා හරිනු ලබන වැඩසටහන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම, ළමයින්ට අහිතකර වැඩසටහන් අත්හිටුවීමට නියෝග කිරීම සහ වැඩසටහන් සම්බන්ධයෙන් ඉදිරිපත්වන පැමිණිලි භාරගැනීම ද වේ. එකී පණතේ එක් වගන්තියක දක්වා ඇත්තේ එම නියාමන කොමිසමේ තීරණය අවසානාත්මක සහ අධිකරණයක් ඉදිරියේ ප්‍රශ්න කළ නොහැකි බවයි.

පුද්ගලික රූපවාහිනී මධ්‍යස්ථානයක් වන LMLමගින් ප.ව.10.00 සිට ප.ව.11.00 අතර කාලය තුළ සතියේ දිනක විසුරුවා හරින එක්තරා වැඩසටහනක් ළමයින් ට අහිතකර බව ට කර්මාන්ත අමාත්‍යවරයා විසින් පැමිණිල්ලක් ගොනු කරන ලදී. මෙම රූපවාහිනී මධ්‍යස්ථාන රජය දැඩිලෙස විවේචනය කර තිබුණි. නියාමන කොමිසම LML ආයතනයේ බලපත්‍රය මාස 6 ක් සඳහා අත්හිටුවනු ලැබිය. LML ආයතනය කියා සිටිනුයේ එකී වැඩ සටහන ප්‍රචාරය කරනු ලබන්නේ සියළුම ළමයින් නිදාගන්නා වේලාවේ සහ ළමුන් රූපවාහිනිය නොබලන වේලාවක බවත් ඇමතිවරයා පැමිණිල්ල කර ඇත්තේ ද්වේශ සහගතව බවත් ය. කොමිසමේ සභාපතිවරයා, LML ආයතනයට අදාළ වැඩ සටහනෙ හි පිටපතක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියේ ය. එම වැඩ සටහන නැරඹීමෙන් අනතුරුව සභාපතිවරයා LML ආයතනයට දැනුම් දෙන ලද්දේ ඔහු විසින් බලපත්‍රය අත්හිටුවීමට ගන්නා ලද තීරණය නොවෙනස්ව පවතින බවයි.

මෙම තීරණය අධිකරණය ඉදිරියේ සාර්ථකව අභියෝගයකට ලක් කළ හැකිදැ යි LML රූපවාහිනී මධ්‍යස්ථානය ඔබගෙන් විමසයි.

ඔබගේ උපදෙස් සඳහා හේතු දක්වමින් LML ආයතනයට උපදෙස් දෙන්න.

02. "**Anisminic v Foreign Compensation Commission** නඩුතීරණය මගින් බලාතික්‍රමණ සිද්ධාන්තයේ නිම් වළලු පුළුල් කරමින් පරිපාලන නීතියේ විප්ලවීය වෙනසක් ඇති කරන ලදී."

සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි. -